ප්‍රාචීන පණ්ඩිත අවසාන පරීක්ෂණය
පාලි II පත්‍රය
(භාෂාව, භාෂා ඉතිහාසය හා පද්‍ය රචනය)
05 දේශනය

# නාම වරනැගීම
# සාධක ප්‍රත්‍යය භාවිතය - 03

*පිංකන්දේ දමිතසාර හිමි*

# පාලිභාෂාවේ ලිංගභේදය

- පාලි - සංස්කෘත මාතෘභාෂාවන්හි පවතින්නේ ජීවවිද්‍යානුකූල (අර්ථානුගත) ලිංගභේදයක් නොව ව්‍යාකරණානුකූල ලිංගභේදයකි, එය සචේතනික අචේතනිකභාවය කේන්ද්‍ර කරගත්තක් නොවේ. ඒ සඳහා නිශ්චිත ක්‍රමවේදයක් මෙතෙක් හඳුනාගෙන නැති අතර එය භාෂා භාවිතය තුළින් ම දත යුතු ය.

- නර-කවි-භික්ඛු-සත්ථු-ගො -- පුරුෂලිංග - **මාතුගාම, දාර** (ස්ත්‍රීවාචක පුරුෂලිංග)
- රුක්ඛ-අත්ත-අග්ගි-කෙතු -- පුරුෂලිංග
- වනිතා-ධෙනු-වධූ-කඤ්ඤා -- ස්ත්‍රීලිංග - **දෙවතා** (පුරුෂවාචක ස්ත්‍රීලිංග)
- සද්ධා-යාගු-ජම්බු-රත්ති -- ස්ත්‍රීලිංග
- චිත්ත-අට්ඨි-ආයු -- නපුංසකලිංග - **මිත්ත** (පුරුෂවාචක නපුංසකලිංග)

  - ලොක (පුං) භුවන (නපුං) පඨවි (පුං) මහී (ස්ත්‍රී)

# නපුංසකලිංග පද සාධනය

- නපුංසක ලිංගයේ පඨමා, ආලපන, දුතියා විභක්ති හැර සෙසු විභක්ති පුරුෂලිංග මෙනි.

  චිත්ත-අට්ඨි-නයන-ගච්ඡන්ත-ගුණවන්තු

- යොනන්නි නපුංසකෙ (217)
- අතො නිච්චං (218)
- සිං (219)
- අං නපුංසකෙ (125)

# මනොගණික ශබ්ද

- "මනං සිරං උරං තෙජං - රජං ඔජං වයං පයං
  යසං තපං වචං චෙතං - එවමාදි මනොගණා"
  සර - තම - අය

- රූපසිද්ධියට අනුව මනොගණික ශබ්ද පුල්ලිඞ්ග වන අතර කච්චායන, බාලාවතාර ව්‍යාකරණ ග්‍රන්ථයන්හි නපුංසකලිංග වේ.
- සසරෙ වාගමො (184)
- මනොගණාදිතො ස්මිංනානමියා (181),
- සස්ස චො (182),
- එතෙසමො ලොපෙ (183),

- තද්ධිත ප්‍රත්‍යයටත් මනෝගණ නාමයටත් අතර ඔකාරාගමය ද සමහරවිට සකාරාගමය ද වේ.

අය + මය - අයෝමය

මන + මය - මනෝමය

වච + ණික - වාචසික

මන + ණික - මානසික

මනෝගණ ශබ්දයක් මුලට යෙදී එය සමග වෙනත් නාමයක් සමාස වන විට ද මැද ඔකාරයක් වේ.

මනෝධාතු - සරෝරුහ

තපෝධන - සිරෝරුහ

පයෝනිධි - තේජෝධාතු

අයෝපාකාර

# සර්වලිංගික (ත්‍රිලිංගික) ශබ්ද (සර්වනාම)

- සියලු ම ලිංගයන්ට සාධාරණ නාම සර්වලිංගික නාම හෙවත් සර්වනාම නම් වේ.
- වරක් යෙදුන නාමයක් නැවත නැවත දැක්විය යුතු කල්හි එම ශබ්දය වෙනුවට එහි ලිංගයට සුදුසු වන ලෙසින් භාෂාවෙහි භාවිත වේ.
- නාමයන්ට විශේෂණව ද සර්වනාම යෙදේ.

නාමයක් වෙනුවට - පුරිසො ගච්ඡති, සො පතති

වනිතා නච්චති, සා අභිරූපා

ඵලං පතති, තං මධුරං භවති

නාමයන්ට විශේෂණව - අයං පුරිසො ඉදං සාසනං පහිණි

ඉමාය වනිතාය අස්මිං පදෙසෙ ගෙහං අත්‍ථි

# සර්වනාම ශබ්ද සහ ලක්ෂණ

- සබ්බ-කතර-කතම-උභය-ඉතර-අඤ්ඤ-අඤ්ඤතර-අඤ්ඤතම-පුබ්බ-පර-අපර-දක්ඛිණ-උත්තර-අධර-ය-ත-එත-ඉම-අමු-කිං-එක-උභ-ද්වි-ති-චතු-අම්හ-තුම්හ (27)
- සර්වනාම ශබ්ද වරනැගීමෙහි විශේෂතා

1. පුරුෂලිංගයෙහි පඨමා බහුවචනය එකාරාන්ත ව සිටී.

   'සබ්බනාමකාරතෙ පඨමො' (164)

2. චතුත්ථී-ඡට්ඨී බහුවචනවල සං-සානං යන්නෙන් අන්තවන රූප සීටි.

   'සබ්බතො නං සංසානං' (168)

3. පුරුෂලිංගයෙහි චතුත්ථී විභක්තියට ආය ආදේශ නොවේ.
4. පුරුෂලිංගයෙහි පඤ්චමී-සත්තමී විභක්තිවලට ආකාරාන්ත, එකාරාන්ත රූප ආදේශ නොවේ.

# අලිංග ශබ්ද

- ලිංගය අනුව රූපමය වශයෙන් වෙනස් නොවන නැතහොත් ශබ්දරූපවලට ලිංග විශේෂයක් නැති ශබ්ද අලිංග නම් වේ. එනම් අම්හ-තුම්හ ශබ්ද දෙකයි.
- පුරුෂ භේදයේ දී උත්තමපුරුෂ හා මධ්‍යමපුරුෂ සංඛ්‍යාවෙහිලා ගැණේ.
- ත්වමහං සිම්හි ච (140)
- මයං යොම්හි පඨමෙ (121)
- තං මමම්හි (143)
- තුම්හස්ස තුවං ත්වමම්හි (146)
- තවං මමං ච නවා (144)
- නාම්හි තයා මයා (145)
- වා තතියෙ ච (150)
- බහුවචනෙසු වො නො (151)

තව මම සෙ (141)

අම්හස්ස මමං සවිභත්තිස්ස සෙ (120)

තුය්හං මය්හං ච (142)

තෙමෙකවචනෙ (148)

තුම්හාම්හෙහි නමාකං (161)

තුම්හාම්හානං තයි මයි (139)

තයා තයීනං තකාරො ත්වත්තං වා (210)

පදතො දුතියා චතුත්ථී ඡට්ඨීසු වො නො (147)

# සංඛ්‍යා ශබ්ද

- ගණන් කියැවෙන නාම සංඛ්‍යා ශබ්ද වේ.
- එක-උභ-ද්වි-ති-චතු සර්වනාම වේ. ද්වි ශබ්දය ලිංගත්‍රයෙහි ම සමාන ය.
- එක ශබ්දය හැර ඉතිරි සංඛ්‍යා ශබ්ද නිත්‍ය බහුවචන වේ.

  - උභාදිතො නමින්නං (86)
  - ඉණ්ණමිණ්ණන්නං තීහි සංඛ්‍යාහි (87)
  - යොසු ද්වින්නං ද්වෙ ච (132)
  - තිචතුන්නං තිස්සො චතස්සො තයො චත්තාරො තීණි චත්තාරි (133)
  - පඤ්චාදීනමකාරො (134)